# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,500 - 2026 ජූලි මස 31 සිකුරාදා - 2026.07.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 3414 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 3443 |


*සැ.යු.*: දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත 2026.07.24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අගෝස්තු මස 21 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අගෝස්තු මස 07 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


3411 - B 82815 - (2026/07)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**පුත්තලම දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.
මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 08 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | මුන්දලම | පුත්තලම් පත්තු කොට්ඨාසයේ පෙරුක්කුවට්ටන් ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |
| පුත්තලම | හලාවත | උතුරු පිටිගල් කෝරළය කොට්ඨාසයේ හලාවත නගර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

07 - 484

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**බදුල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 07 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | වැලිමඩ | බොරලන්ද කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ උඩුකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

07 - 485

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මොණරාගල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යොමුකළ යුතු ලිපිනය* |
|---|---|---|---|
| මොණරාගල | මඩුල්ල | පොතුලියද්ද කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ මඩුල්ල කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල |

07 - 486

## යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම (කෙටිකාලීන කෙඩෙට් නිලධාරි පාඨමාලාව - ඩිප්ලෝමා)

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කෙඩෙට් නිලධාරීන්හට හමුදා අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමාව පිරිනැමේ. ඔවුන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙන් අධිකාරියට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තුවකට/බලකායකට ඇතුළත් කරනු ලැබේ.

3. මූලික සුදුසුකම්:

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියෙකු විය යුතු යි. |
| (ආ) | විවාහක/අවිවාහක බව | : අවිවාහක. |
| (ඇ) | වයස | : 2026 ඔක්තෝබර් මස 01 දිනට වයස අවුරුදු 18 ත් 23 ත් අතර විය යුතු යි. |
| (ඈ) | උස | : අඩි 5 යි අඟල් 6 ට (167.5cm) නොඅඩු විය යුතු යි. |
| (ඉ) | බර | : කි.ග්‍රෑ. 52 (රාත්තල් 118) ට නොඅඩු විය යුතු යි. |
| (ඊ) | පපුව | : අඟල් 32 ට නොඅඩු විය යුතු යි. |
| (උ) | දෘෂ්ටි තීක්ෂණත්වය | : හුරු ඇස 6/6 විය යුතු ය ( උපැස් සහ කාච රහිතව). |
| (ඌ) | ශරීර ස්කන්ධ දර්ශකය | : 18.5 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතු ය. |

4. අධ්‍යාපන සුදුසුකම්:

(අ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයයන් තුනක් (03) සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ S), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය “YES” ලෙස සඳහන්ව තිබීම;

*සහ*

(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ (C) සමග විෂයයන් අටක් (08) සමත්වීම (විද්‍යාව විෂයය ඇතුලුව) හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, ගණිතය හා සිංහල/දෙමළ විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ NVQ Level 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඉංග්‍රීසි සඳහා උපාධි/ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතු ය);

*හෝ*

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාග වලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතු ය (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුලුව).

5. වෙනත් සුදුසුකම්. ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. පොදු:

(අ) පුහුණුවීම් ලබන කාලය තුළදී කෙඩෙට් නිලධාරීන්හට විවාහවීමට අවසර දෙනු නොලැබේ.
(ආ) මනා ශාරීරික සෞඛ්‍ය තත්වයේ සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතු යි.

7. සේවා කොන්දේසි:

(අ) පුහුණු කාලසීමාව අවසානයේ සිට (අධිකාරියට පත්කරනු ලබන දිනයේ සිට) වසර 10 ක් අනිවාර්යයෙන්ම යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතු ය. ඒ සඳහා යුද්ධ හමුදාව සමඟ ඇපබැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

(ආ) පුහුණුවීම ලබන කාලසීමාව තුළදී කෙඩෙට් නිලධාරියෙකුගේ මාසික වැටුප සියලු දීමනා සහිතව රු:105,415.80 කි. කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් සේවය කරන කාලය තුළ දී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

(ඇ) කෙඩෙට් නිලධාරීන්හට ශ්‍රී ලංකාවේ දී මාස 15ක කාලයක් යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණුවීම්වල නිරත වීමට සිදු වේ.

(ඈ) පුහුණුවීමේ කාලය තුළ දී කෙඩෙට් නිලධාරීන්ගේ තරාතිරම සෙසුනිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

(ඉ) පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම:

(1) පුහුණුවීම් කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුනු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(2) කෙඩෙට් නිලධාරියෙකු පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතූන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්ෂක නිශ්කාෂන, තමන් විසින් වළක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතූන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කෙඩෙට් නිලධාරියෙකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් බැඳීමට නොහැක.

8. වැටුප් හා දීමනා : ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ නිලධාරීන් වශයෙන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙහි අධිකාරියට පත්කරනු ලැබීමේ දී, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන්ට අදාළ වන පහත දැක්වෙන වැටුප් තලයෙහි/පරිමාණයෙහි තබනු ලැබේ:

| *අ: අ:* | *නිලය* | *කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025 ට අනුව ඒකබද්ධ වැටුප* | | *වැටුප් වර්ධක* |
|---|---|---|---|---|
| | | *2026* | *2027* | |
| 1 | දෙවන ලුතිනන් | 60,709.00 | 65,880.00 | ස්ථිර |
| 2 | ලුතිනන් | 74,438.00 | 82,150.00 | 30x2400 |
| 3 | කපිතන් | 86,601.00 | 96,550.00 | 24x2400 |
| 4 | මේජර් | 94,710.00 | 106,150.00 | 22x2400 |
| 5 | ලුතිතන් කර්නල් | 97,192.00 | 109,090.00 | 17x2940 |
| 6 | කර්නල් | 117,857.00 | 133,570.00 | 17x3900 |
| 7 | බ්‍රිගේඩියර් | 124,446.00 | 141,370.00 | 15x3900 |
| 8 | මේජර් ජෙනරාල් | 136,575.00 | 156,000.00 | 12x4850 |
| 9 | ලුතිනන් ජෙනරාල් | 144,770.00 | 165,700.00 | 10x4850 |
| 10 | ජෙනරාල් | 157,063.00 | 180,250.00 | 7x4850 |

9. අනෙකුත් දීමනා : පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ:

(අ) සුදුසුකම් දීමනා,
(ආ) නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව,
(ඇ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරීන්ට පමණක්),
(ඈ) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

10. පහත සඳහන් පහසුකම්/දීමනා ගෙවනු ලැබේ:

(අ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.
(ආ) කුලී නිවාසයක වාසය කරන විට ගෙවල් කුලී දීමනා.
(ඇ) නොමිලේ නිල ඇඳුම්.
(ඈ) විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරීන් අනුගාමික සේවය.
(ඉ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරීන්ට රාජකාරී ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරී දුම්රිය බලපතක්.

11. වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරින්ට බලපවත්වනු ලැබේ:

(අ) කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025.

(ආ) යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(ඇ) 1993 අගෝස්තු මස 17 වන දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බල හමුදා) සේවා නියෝගය.

(ඈ) 1989 ජුනි මස 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

12. මෙහි පහත 13 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළයුතු වේ. තෝරාගත් අපේක්ෂකයින්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමඟ ඇපබැඳුම්කරයකට අත්සන් කළ යුතු ය. විශේෂ අවස්ථාවලදී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරියෙකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරීත්වය හිමිවනු ලැබේ.

13. අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය:

(*අ*) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරි අයදුම්කරුවෙකු වන ..........ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(*ආ*) ශ්‍රී ලංකාවේදී හෝ විදේශයකදී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගතිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළදී අයදුම්කරුහට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට,

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරිය අවසන් කළහොත්, ඔහු වෙනුවෙන් රජයට දැරීමට සිදු වූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට,

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින්ම වළක්වාලිය හැකි හේතූන් නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මඟින් ඔහු වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

* නොගැලපෙන වචන කපා හරින්න.

.............................................................,
මව/පියා/භාරකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන්:..........................................................................................

දිනය :...................................

සාක්ෂිකරුගේ අත්සන :......................................

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :..........................................................................................

14. භාෂා අවශ්‍යතා : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට

මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරාගත් අයදුම්කරුවන් ක්‍රියා කළ යුතු වේ.

15. අනන්‍යතාවය තහවුරු කිරීම :

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද "රියදුරු බලපත්‍රය" පිළිගනු ලැබේ.

16. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අයදුම්කරු මුදවාලිය හැකි බවට සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු යි.

17. ඉල්ලුම් පත්‍ර :

ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්කරුගේම අත් අකුරින් සම්පූර්ණකර 2026 ජූලි මස 31 දින 1200 පැයට හෝ ඊට පෙර ලැබෙන සේ "පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල'' යන ලිපිනයට එවිය යුතු වේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙලවරේ "යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙටි කාලීන කෙඩෙට් නිලධාරි පාඨමාලා අංක 26 (ඩිප්ලෝමා) පාඨමාලාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය'' යනුවෙන් සඳහන් කළ යුතු වේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට පෙර හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මඟින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක්ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk/officers වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

18. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකපත්හි ඡායා පිටපත් එවිය යුතු ය:

(අ) උප්පැන්න සහතිකය.
(ආ) ඉදිරිපත්කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික.
(ඇ) ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.
(ඈ) තව ද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්ද මෑතක දී ලබාගත් 2'' x 2½'' ප්‍රමාණයේ නිල් පසුබිම සහිත වර්ණ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු විසින් සහතිකකර එවිය යුතු ය.

19. සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම :

ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණ වලට පෙනී සිටිය යුතු යි. එම පරීක්ෂණයන්ගෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

20. තේරීම් මණ්ඩලය මඟින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල හිදී පැවැත්වීමට කටයුතු සිදුකරනු ලබන අතර, අයදුම්කරුවන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මඟින් ආපසු ගෙවනු නොලැබේ.

21. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්ෂකයා නුසුදුස්සෙකු වනු ඇත.

22. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන් වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කරුවන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

*සටහන:* මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළ වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**බී කේ ජී එම් එල් රොද්‍රිගෝ**
ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2026 මාර්තු මස 25 දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

07 - 491/1

**යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත කාන්තා කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**
**(කාන්තා කෙඩෙට් නිලධාරි පාඨමාලාව - ඩිප්ලෝමා)**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කාන්තා කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කාන්තා කෙඩෙට් නිලධාරීන්හට **හමුදා අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමාව පිරිනැමේ.** ඔවුන් **දෙවන ලුතිනන්** වන ආරම්භක නිලයෙන් අධිකාරියට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තුවකට/බලකායකට ඇතුළත් කරනු ලැබේ.

3. **මූලික සුදුසුකම්:**

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික කාන්තා පුරවැසියකු විය යුතු යි. |
| (ආ) | විවාහක/අවිවාහක බව | : අවිවාහක |
| (ඇ) | වයස | : 2026 ඔක්තෝබර් මස 01 දිනට වයස අවුරුදු 18 ත් 22 ත් අතර විය යුතු යි. |
| (ඈ) | උස | : අඩි 5 යි අඟල් 3 ට (162 cm) නොඅඩු විය යුතු යි. |
| (ඉ) | බර | : කි.ග්‍රෑ. 45 (රාත්තල් 99 ) ට නොඅඩු විය යුතු යි. |
| (ඊ) | දෘෂ්ටි තීක්ෂණත්වය | : 6/6 විය යුතුය ( උපැස් සහ කාච රහිතව). |
| (උ) | ශරීර ස්කන්ධ දර්ශකය | : 18.5 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතු ය. |

4. **අධ්‍යාපන සුදුසුකම්:**

(අ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් තුනක් (03) සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ S), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය “YES” ලෙස සඳහන්ව තිබීම;

*සහ*

(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ (C) සමග විෂයයන් අටක් (08) සමත්වීම (විද්‍යාව විෂය ඇතුළුව) හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, ගණිතය හා සිංහල/දෙමළ විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කාරිනියන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ NVQ Level 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඉංග්‍රීසි සඳහා උපාධි/ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය);

*හෝ*

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාග වලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුළුව).

5. **වෙනත් සුදුසුකම්** : ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. **පොදු:**

(අ) පුහුණුවීම් ලබන කාලය තුළදී කාන්තා කෙඩෙට් නිලධාරීන්හට විවාහවීමට අවසර දෙනු නොලැබේ.

(ආ) මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයේ සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන සියලුම අයදුම්කාරිනියන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතු යි.

7. **සේවා කොන්දේසි:**

(අ) පුහුණු කාලසීමාව අවසානයේ සිට (අධිකාරියට පත්කරනු ලබන දිනයේ සිට) වසර 10 ක් අනිවාර්යයෙන්ම යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතුය. ඒ සඳහා යුද්ධ හමුදාව සමග ඇපබැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

(ආ) පුහුණුවීම ලබන කාලසීමාව තුළදී කාන්තා කෙඩෙට් නිලධාරියකුගේ මාසික වැටුප සියලු දීමනා සහිතව රු:105,415.80 කි. කාන්තා කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් සේවය කරන කාලය තුළදී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

(ඇ) කාන්තා කෙඩෙට් නිලධාරින් හට ශ්‍රී ලංකාවේදී මාස 15ක කාලයක් යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණුවීම්වල නිරත වීමට සිදුවේ.

(ඈ) පුහුණුවීමේ කාලය තුළදී කාන්තා කෙඩෙට් නිලධාරින්ගේ තරාතිරම සෙසු නිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

(ඉ) **පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම:**

(1) පුහුණුවීම් කාලසීමාව තුළදී කාන්තා කෙඩෙට් නිලධාරියකු සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කාන්තා කෙඩෙට් නිලධාරි වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුනු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(2) කාන්තා කෙඩෙට් නිලධාරියකු පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතූන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්ෂක නිශ්කාෂන, තමන් විසින් වළක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරින් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඇය වෙනුවෙන් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතූන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කාන්තා කෙඩෙට් නිලධාරියකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කාන්තා කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් බැඳීමට නොහැක.

8. **වැටුප් හා දීමනා :** ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ නිලධාරිනියන් වශයෙන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙහි අධිකාරියට පත්කරනු ලැබීමේ දී, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරින්ට අදාළ වන පහත දැක්වෙන වැටුප් තලයෙහි/පරිමාණයෙහි තබනු ලැබේ:

| *අ: අ:* | *නිලය* | *කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2025 ට අනුව ඒකාබද්ධ වැටුප* | | *වැටුප් වර්ධක* |
|---|---|---|---|---|
| | | *2026* | *2027* | |
| 1 | දෙවන ලුතිනන් | 60,709.00 | 65,880.00 | ස්ථිර |
| 2 | ලුතිනන් | 74,438.00 | 82,150.00 | 30x2400 |
| 3 | කපිතන් | 86,601.00 | 96,550.00 | 24x2400 |
| 4 | මේජර් | 94,710.00 | 106,150.00 | 22x2400 |
| 5 | ලුතිතන් කර්නල් | 97,192.00 | 109,090.00 | 17x2940 |
| 6 | කර්නල් | 117,857.00 | 133,570.00 | 17x3900 |
| 7 | බ්‍රිගේඩියර් | 124,446.00 | 141,370.00 | 15x3900 |
| 8 | මේජර් ජෙනරාල් | 136,575.00 | 156,000.00 | 12x4850 |
| 9 | ලුතිනන් ජෙනරාල් | 144,770.00 | 165,700.00 | 10x4850 |
| 10 | ජෙනරාල් | 157,063.00 | 180,250.00 | 7x4850 |

9. **අනෙකුත් දීමනා :** පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ:-

(අ) සුදුසුකම් දීමනා;
(ආ) නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව;
(ඇ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරිනියන්ට පමණක්);
(ඈ) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

10. පහත සඳහන් පහසුකම්/දීමනා ගෙවනු ලැබේ:-

(අ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්;
(ආ) කුලී නිවාසයක වාසය කරන විට ගෙවල් කුලී දීමනා;
(ඇ) නොමිලේ නිල ඇඳුම්;

(ඈ) විවාහක නිලධාරිනියන් හට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරිනියන් අනුගාමික සේවය;
(ඉ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරිනියන් හට රාජකාරී ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරී දුම්රිය බලපතක්.

11. **වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරිනියන් හට බලපවත්වනු ලැබේ:**

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2025;

(ආ) යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය;

(ඇ) 1993 අගෝස්තු මස 17 වන දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කළ සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බල හමුදා) සේවා නියෝගය;

(ඈ) 1989 ජුනි මස 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කළ සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

12. මෙහි පහත 13 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළයුතු වේ. තෝරා ගත් අපේක්ෂිකාවන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂිකාවන් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණු වලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමග ඇපබැඳුම්කරයකට අත්සන් කළ යුතු ය. විශේෂ අවස්ථා වල දී හැර පියා ජීවතුන් අතර සිටින කාන්තා කෙඩෙට් නිලධාරියකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරීත්වය හිමිවනු ලැබේ.

13. **අයදුම්කාරියගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය:**

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාන්තා කෙඩෙට් නිලධාරි අයදුම්කාරිනියක වන ..........ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(ආ) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයකදී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කාරිය තෝරා ගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි:-

(1) පුහුණුවීමේ කාලසීමාව තුළදී අයදුම්කාරියහට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට;

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කාරිය සිය කැමැත්තෙන්ම අධිකාරිය අවසන් කළහොත්, ඇය වෙනුවෙන් රජයට දැරීමට සිදුවූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට;

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කාරිය කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඇයට තමන් විසින්ම වළක්වාලිය හැකි හේතූන් නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඇය වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

* *නොගැලපෙන වචන කපා හරින්න.*

.............................................,
මව/පියා/භාරකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන්:.......................................................................................
දිනය :...................................
සාක්ෂිකරුගේ අත්සන :......................................
නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :.......................................................................................

14. **භාෂා අවශ්‍යතා.- ශ්‍රී ලංකා** ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරා ගත් අයදුම්කාරිනියන් ක්‍රියා කළ යුතු වේ.

15. **අනන්‍යතාවය තහවුරු කිරීම.- අයදුම්කාරිනියන් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද** "රියදුරු බලපත්‍රය" පිළිගනු ලැබේ.

16. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අයදුම්කාරිනිය මුදවාලිය හැකි බවට සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු යි.

17. **ඉල්ලුම් පත්‍ර.-** ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්කාරිනියගේම අත් අකුරින් සම්පූර්ණ කර 2026 ජූලි මස 31 දින 1200 පැයට හෝ ඊට පෙර ලැබෙන සේ **''පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල"** යන ලිපිනයට එවිය යුතුවේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙලවරේ **''යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කාන්තා කෙඩෙට් නිලධාරි (ඩිප්ලෝමා) පාඨමාලාවේ කාන්තා කෙඩෙට් නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය"** යනුවෙන් සඳහන් කළ යුතුවේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට පෙර හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මගින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක්ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk/officers වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

18. **ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකපත් හි ඡායා පිටපත් එවිය යුතු ය:-**

(*අ*) උප්පැන්න සහතිකය;
(*ආ*) ඉදිරිපත්කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික;
(*ඇ*) ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික;
(*ඈ*) තව ද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්ද මෑතකදී ලබාගත් 2" x 2½" ප්‍රමාණයේ නිල් පසුබිම සහිත වර්ණ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයකු විසින් සහතිකකර එවිය යුතු ය.

19. **සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම.- ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කාරිනියන් මූලික තේරීම් වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කාරිනියන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණ වලට පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණයන්ගෙන් තෝරා ගනු ලබන අයදුම්කාරිනියන් ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.**

20. තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපියක් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය **පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල හි දී පැවැත්වීමට කටයුතු සිදුකරනු ලබන අතර, අයදුම්කාරිනියන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ආපසු ගෙවනු නොලැබේ.**

21. අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්ෂිකාව නුසුදුස්සකු වනු ඇත.

22. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කාරිනියන් වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කාරිනියන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

***සටහන:*** **මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.**

**බී. කේ. ජී. එම්. එල්. රොද්‍රිගෝ**
ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2026 මාර්තු මස 25 දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

07 - 491/2

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

### නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය;

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය;

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය;

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ;

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය;

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය;

*සැ. යු.- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.*

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය;

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය;

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක;

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යොමුකළ යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | වලපනේ | වලපනේ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |
| නුවරඑළිය | වලපනේ | වලපනේ ඔයපළාත කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |
| නුවරඑළිය | අඹගමුව | අඹගමුව උතුර කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

07 - 530

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය;

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය;

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ;

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය;

*සැ. යු.- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.*

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය. රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය;

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | අඹගමුව | හැටන් - දික්ඔය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |
| නුවරඑළිය | නුවරඑළිය | තලවකැලේ ලිඳුල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

07 - 531

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මහනුවර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31** දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩපළාත | කඳුකර ඉහළ නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා උඩපළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | යටිනුවර | උඩුනුවර - යටිනුවර කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | කඩවත්සතර හා ගඟවට කෝරළය | කඩවත්සතර හා ගඟවට කෝරළය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මහනුවර නගරය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | පස්බාගේ කෝරළේ | පස්බාගේ කෝරළේ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩපළාත | උඩපළාත කොට්ඨාසයේ සිංහාපිටිය ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩුනුවර | වතුපොල ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර (වැලිගල්ල) කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | පාතහේවාහැට | පාතහේවාහැට කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

07 - 532

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**මහනුවර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැලෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.
***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 26 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | කඩවත්සතර හා ගඟවට කෝරළය | කටුගස්තොට කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

07 - 533

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**මහනුවර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | පස්බාගේ කෝරළය | නාවලපිටිය දිස්ත්‍රික් රෝහල ඇතුළත් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

07 - 534

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මාතලේ දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අයවිය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 31 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජූලි මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යොමු කළ යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | මාතලේ | ගම්පහසිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාතලේ දකුණ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ |
| මාතලේ | විල්ගමුව | හඳුන්ගමුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාතලේ නැගෙනහිර විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ |

07 - 568

---

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පී නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහයක තනතුර සඳහා බඳවා ගැනීම - 2026**

නිවැරදි කිරීම

2026 පෙබරවාරි මස 27 වැනි දින අංක 2,478 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පී නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහයක තනතුර සඳහා බඳවා ගැනීම - 2026 හි 5 (අ) හි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පටිපාටියෙහි ලකුණු ප්‍රමාණයන් ආයතනික මුද්‍රණ දෝෂයක් හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු ලබා දීමේ ප්‍රමාණයන්ට වඩා වෙනස් වී ඇති බැවින් පහත පරිදි නිවැරදි කර ඇත.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

(අ)

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|
| 01. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | 30 | 40% |
| 02. පළපුරුද්ද | 35 | |
| 03. වෘත්තීය සුදුසුකම් | 30 | |
| 04. සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කරන කුසලතාව | 05 | |
| **එකතුව** | **100** | |

**එස්. අච්චුදන්,**
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

07 - 564

---

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

**ඇබෑර්තු**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ආරක්ෂක නිලධාරි තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026.08.17** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

**ආරක්ෂක නිලධාරි තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 03)**

**1. වැටුප් පරිමාණය:**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240-9x540/10x590/3x680-රු. 60,040 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 87,000.00ක් පමණ වේ).

**2. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වී තිබීම;

***සහ***

වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත යුද්ධ හමුදාවේ සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවක (නිත්‍ය) සාමාජිකයෙකු හෝ වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයෙකු වීම;

***හෝ***

අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ 'ඒ' හෝ 'බී' වැටුප් කාණ්ඩවලට අයත් තනතුරක වසර 10ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**3. <u>වයස් සීමාව</u> :**

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතු ය. (පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**4. බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මගිනි.

(*අ*) **ලිඛිත පරීක්ෂණය:**
භාෂා හැකියාව සහ සාමාන්‍ය දැනීම පරීක්ෂා කර බලනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

(*ආ*) **සම්මුඛ පරීක්ෂණය :**
ලිඛිත පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

| | **නිර්ණායක** |
|---|---|
| 01 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 02 | විෂය දැනුම |
| 03 | පළපුරුද්ද |
| 04 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා |

**5. සේවා නියමයන් හා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත්, ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ඇත.

**6.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් **(මුල් පිටපත් නොවේ)** සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය;
(*ආ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(*ඇ*) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(*ඈ*) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික;

**7.** සන්නද්ධ හමුදාවල සහ ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ සන්නද්ධ හමුදාධිපති හෝ පොලිස්පති හරහා එවිය යුතු ය.

**8.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**9.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර හෝ කරුණක් වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**10.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන අයදුම්පත් (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**11.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

හංස අබේරත්න,
*වැ.බ.* පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2026 ජුලි මස 28 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ආදර්ශ අයදුම්පත්‍රය

...................... තනතුර

01. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්):-
…………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :-
…………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs. /Miss)
…………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………

02. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | | | | |

03. (අ) i). පෞද්ගලික ලිපිනය :-
………………………………………………………………………………………
………………………………………………………………………………………

ii). දුරකතන අංකය :- | | | | | | | | | | |

iii). WhatsApp දුරකතන අංකය :- | | | | | | | | | | |

iv). විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය:-........................................................

(ආ) i).කාර්යාලයීය ලිපිනය :-
………………………………………………………………………………………
………………………………………………………………………………………

ii). දුරකථන අංකය:- | | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය -:

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (අ) උපන් දිනය:- වර්ෂය : ................ මාසය : .............. දිනය : ...............
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස:- අවුරුදු : ........ මාස : ........ දින : ........

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/නැත)

08. *අධ්‍යාපන සුදුසුකම් :-* (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| *විභාගය* | *විෂයය* | *සාමාර්ථයන්* | *සමත්වූ වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | සිංහල/ දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෙනත් සුදුසුකම් :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)
......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................

10. පළපුරුද්ද :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| *ආයතනය/දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර - :

(*අ*) ආයතනයේ නම හා ලිපිනය :..................................................................................
(*ආ*) මුල් පත්වීමේ දිනය :........................................................................................
(*ඇ*) දැනට දරන තනතුර :.........................................................................................
(*ඈ*) මාසික මූලික වැටුප :.......................................................................................
(*ඉ*) දීමනා :.................................................................................................................
(*ඊ*) දළ වැටුප:.............................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න:-
.............................................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය :- ........................................ ................................................,
අයදුම්කරුගේ අත්සන.

**ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

**(සන්නද්ධ හමුදාවල සහ ශ්‍රී ලංකා පොලීසියේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

ශ්‍රී ලංකා යුද්ධ / ගුවන් / නාවික හමුදාවේ / පොලීසියේ ......................................... තනතුර දරන, ................................... ......................................... ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට / ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

දිනය :-.....................................

.........................................................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

07 - 565

---

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් කැඳවනු ලැබේ.

**1. කළමනාකරණ සහකාර - තාක්ෂණ (මෘදුකාංග හා දෘඩාංග තාක්ෂණ ශිල්පී) - පුරප්පාඩු 01**

**අවම සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන් :-**
අධ්‍යාපන :
එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා පස්වැනි මට්ටමට (NVQ - 05) නොඅඩු මට්ටමක දෘඩාංග හා මෘදුකාංග පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්:
ජාතික වෘත්තීය කුසලතා පස්වැනි මට්ටමට (NVQ - 05) නොඅඩු මට්ටමක සහතිකය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**
ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහාවන සුදුසුකම් අදාළ වේ.

**වැටුප් පරිමාණය :**

**2025.03.25** දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය **රුපියල් 50,540 - 10 x 540 - 7 x 630 – 4 x 1,080 - 20 x 1,280 – රු. 90,270 /-(MA 2-2 - 2025)** ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**වයස් සීමාව :**

අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**2. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සුදුසුකම් (අනිවාර්ය පොදු සුදුසුකම්)**

**බාහිර අයදුම්කරුවන් :**

අධ්‍යාපන:
සිංහල හෝ දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

(*අ*) ප්‍රාථමික ශ්‍රේණිය -ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී
I. සිංහල / දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව
යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර(04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම්/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවයන් අදාළ අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක).

(*ඇ*) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය.

(*ඉ*) නියමිත දිනට පූර්වාසන්නට ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

**වැටුප් පරිමාණය :**

**2025.03.25** දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය **රුපියල් 46,220 - 10 x 540 - 7 x 630 – 12 x 1,080 - 12 x 1,280 – රු. 84,350 /-(MA 1-2 - 2025)** ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**වයස් සීමාව :**
අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සෑම අයදුම්කරුවෙක්ම -**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.
II. තනතුරට අදාළ රාජකාරි මනාව සේවය කිරීමට කායික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.
III. මනා චරිතයකින් යුක්ත පුද්ගලයෙකු විය යුතු ය.

**අනෙකුත් දීමනා:**

ජීවන වියදම් දීමනාව සහ රජයෙන් අනුමත අනෙකුත් දීමනා.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ඉහත සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතුරෙන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී සහ / හෝ ලිඛිත තරඟ විභාගයක දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ.

**සේවා කොන්දේසි:**

මෙම තනතුරු ස්ථිරය. වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.
සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල : සේවකයා තම වැටුපෙන් 8% ක ප්‍රමාණයකින් හා සේවා යෝජකයා 12% ක ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක වේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ප්‍රමාණයකින් සේවායෝජකයා ගෙවනු ලබයි.

**අයදුම් කිරීමේ පිළිවෙල :**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වෙබ් අඩවියේ https://judgesinstitute.lk/ පළකර ඇති ආදර්ශ අයදුම්පත(සහතික පත්‍රවල සහතික පිටපත් සමඟ) නිසි පරිදි සම්පූර්ණ කර 2026.08.21 වැනි දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් යොමුකළ යුතු ය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතු ය. අයදුම්පත් ලියාපදිංචි තැපැලට යොමු කරන දිනය නොව ආයතනයට ලැබෙන දිනය, වලංගු දිනය බවට සැළකීමේ අයිතිය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සතුව පවතින අතර අයදුම්පත් ලියාපදිංචි තැපැල

මගින් යොමු කිරීමට අමතරව https://judgesinstitute.lk/ වෙබ් අඩවියේ අයදුම් කරන තනතුරට අදාළ සබැඳිය ඔස්සේ පවතින ගූගල් පෝරමය සම්පූර්ණ කර යොමු කළ යුතු ය.

රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද තැපැලේ දී නැති වූ බවට ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,
අංක 80 (5 වන හා 6 වන මහල),
අධිකරණ මාවත,
කොළඹ 12.

**ආදර්ශ අයදුම්පත්‍රය**

අයදුම් කරන තනතුර : ..........................................................................................

*පුද්ගලික තොරතුරු*

සම්පූර්ණ නම :..........................................................................................

මුලකුරු සහිත නම :..........................................................................................

පුද්ගලික ලිපිනය :..........................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................

උපන් දිනය :..........................................................................................

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු :.................. මාස :.................. දින :..................

දුරකථන අංකය :..........................................................................................

විද්‍යුත් තැපැල් ලිපිනය :..........................................................................................

ස්ත්‍රී / පුරුෂ භාවය :..........................................................................................

අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා/පෙළ) විභාගය

| විෂයය | | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |

අ.පො.ස. (උ/පෙළ) විභාගය

| විෂයය | | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

වෙනත් අධ්‍යාපන සුදුසුකම් (උපාධි/ ඩිප්ලෝමා හෝ උසස් අධ්‍යාපන සුදුසුකම්) :

01. ..........................................................................................................................................
02. ..........................................................................................................................................
03. ..........................................................................................................................................
04. ..........................................................................................................................................
05. ..........................................................................................................................................

වෘත්තීය සුදුසුකම් :

01. ..........................................................................................................................................
02. ..........................................................................................................................................
03. ..........................................................................................................................................
04. ..........................................................................................................................................
05. ..........................................................................................................................................

සේවා පළපුරුද්ද :

01. ..........................................................................................................................................
02. ..........................................................................................................................................
03. ..........................................................................................................................................
04. ..........................................................................................................................................
05. ..........................................................................................................................................

(කරුණාකර ඔබ අයදුම්කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් සපුරා තිබේදැයි සඳහන් කරන්න. (ඔව්/ නැත)

ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු :

| | |
|---|---|
| 1. නම | 2. නම |
| තනතුර | තනතුර |
| දුරකථන අංකය | දුරකථන අංකය |

අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන්කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශකර සිටිමි.

අයදුම්කරුගේ අත්සන ................................ දිනය ................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරුවන ................................................................. මහතා/ මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ................................ ලෙස ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයෙකු/ සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බව දන්වමි.

නම :..........................................................................................................................................
තනතුර :..........................................................................................................................................
ලිපිනය :..........................................................................................................................................
දිනය :..........................................................................................................................................

07 - 545

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 02 සේවා ගණයේ තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය) III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2025(2026)

01. අමප 25/1691/802/004 – X හා 2025.09.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි **තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 නොවැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www. doenets.lk** වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 අගෝස්තු මස 03 වැනි දින පෙ.ව. 09.00ට** විවෘත වන අතර **2026 අගෝස්තු මස 31 දින ප.ව. 09.00ට අවසන් වේ.**

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව **තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ලැබේ.

03. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහ 2022.12.14 දිනැති** ***අති විශෙෂ ගැසට් පත්‍රයේ*** **පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)** III **ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.**

(ආ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, අමාත්‍යාංශ ලේකම් හට ඒ සඳහා බලය ඇත.

(ඇ) මෙම පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්වේ. **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 02 සේවා ගණයේ** බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පරිදි බඳවාගෙන වසර 03ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු යි.

(ඈ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

**04. 2025.03.25** දිනැති **10/2025** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **MN 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු.45,230 -10x540 -11 x 630 -10 x 890 - 10 x1,190 - රු. 78,360 ක් වේ. එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.**

05. **මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.)**

06. **තනතුරට අයත් කාර්ය භාරය :**

**තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)**

**1. පාසල්වල තාක්ෂණ පීඨයේ ජෛව පද්ධති තාක්ෂණවේදය විද්‍යාගාර පිළිබඳ භාරකාරිත්ව හා ඒ පිළිබඳ සම්පූර්ණ වගකීම.**

**2.** **ජෛව පද්ධති තාක්ෂණවේදය උපකරණ තොග පවත්වාගෙන යාම හිඟ හඳුනා ගැනීම හා අවශ්‍ය ප්‍රමාණ ඇණවුම් කිරීම සඳහා සහාය වීම හා භාණ්ඩ නිදහස් කිරීම.**

**3.** **අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ තිබෙන උපකරණ අලුත්වැඩියා කිරීම, රසායනාගාර ද්‍රව්‍ය, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, උපකරණ, ගබඩා අල්මාරි ආදියට සිදු විය හැකි අලාභහානි වලක්වා ගැනීම, ඒවා සොරසතුරන්ගෙන් ආරක්ෂා කිරීමට කටයුතු සැලැස්වීම හා එසේ විය හැකි අවස්ථා අවම කරලීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.**

**4.** **රසායනික ද්‍රව්‍ය, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, උපකරණ, ගබඩා අල්මාරි ආදි පරීක්ෂණාගාරයේ තිබෙන සියලුම භාණ්ඩ පිළිබඳව පූර්ණ වගකීම හා අදාළ ලේඛන ක්‍රමානුකූලව පවත්වාගෙන යාම.**

**5.** **අවශ්‍ය පරීක්ෂණ කිරීම සඳහා ගුරුවරුන්ට හා සිසුන්ට සහාය ලබා දීම.**

**6.** **උපකරණ හා ද්‍රව්‍යවල ආරක්ෂාව පිළිබඳව වඩාත් සැලකිලිමත් වෙමින් අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම.**

**7.** **තාක්ෂණ පීඨයේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට හැකි වන පරිදි කටයුතු සංවිධානය කරලීම.**

**8.** **රසායන ද්‍රව්‍ය නිසි පරිදි අසුරා තැබීම, ගබඩා කිරීම මගින් සිසුන් හට සිදු විය හැකි හානිවලින් ආරක්ෂා කිරීම.**

**9.** **තම විෂය පථයට අදාළ කරුණු පිළිබඳව තමාගේ අධීක්ෂණ නිලධාරින් සමඟ මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම සහ ඔවුන් විසින් පවරන වෙනත් රාජකාරී ඉටු කිරීම.**

07. ***සුදුසුකම් : -***

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයට** අයත් තනතුරුධාරීන් සීමිත පදනම මත **තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)** යන තනතුරට අයදුම් කිරීමට,

**(අ)** ***අධ්‍යාපන සුදුසුකම් : -***

**තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී මව් භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතු ය.

**(ආ)** පළපුරුද්ද : -

නියමිත දිනට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථාන ඇතුළු සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත් ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**(ඇ)** *වෙනත් සුදුසුකම් : -*

I. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර පත්වීමක් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කර තිබිය යුතු ය.

II. යම් තනතුරක ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම්/ කොන්ත්‍රාත් පදනම මත සේවා කාල පරිච්ඡේදයන් සහ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇති පුහුණුවීම් කාල පරිච්ඡේද ගණන් ගනු නොලැබේ.

III. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති විය යුතු ය.

V. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර තිබිය යුතු ය.

VI. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.
උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

08. *විභාග පටිපාටිය :*

මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

09. ඇගයීමේ ක්‍රමවේදය

| | ලකුණු | |
|---|---|---|
| සාමාන්‍ය දැනීම (ලිඛිත පරීක්ෂණය) | 100 | (කාලය පැය 01) |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | 100 | (කාලය පැය 01) |
| යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය | 50 | |

**I සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි ලකුණු 100 )**

ඉහත 06 හි දක්වා ඇති පරිදි තනතුරට අදාළ රාජකාරී ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම.

**II බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි ලකුණු 100 )**

අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කර ඇති බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

**III යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය (ලකුණු 50 )**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයන් විසින් මෙහි 10 ඡේදය යටතේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු යි. මෙහි දී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ.

මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය යන එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් ලබා සමත් විය යුතු ය. ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු හෝ කුසලතා අනුපිළිවෙළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙනු නොලැබේ) ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව ලකුණු ලබා දෙන අතර මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත් ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුව මත එක් එක් අයදුම්කරුවන්ගේ කුසලතාව නිර්ණය කරනු ලැබේ.

**10. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව තාක්ෂණ පීය සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය) තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ පටිපාටිය - 2025(2026)**

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු* | |
|---|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>(i) අ.පො.ස (සා.පෙළ) | • විශිෂ්ට සාමර්ථ්‍යය - එක් විෂයයකට ලකුණු 02 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 01 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් (ගණිතය, මව්බස, ඉංග්‍රීසි තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යය ලබා තිබීමට අමතරව ) | 10 | **15** |
| (ii) අ.පො.ස (උ.පෙළ) | • විශිෂ්ට සාමර්ථ්‍යය - එක් විෂයයකට ලකුණු 2 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 1 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් | 5 | |

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු | |
|---|---|---|---|
| (iii) උපාධි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. | 15 | |
| 02. සේවා පළපුරුද්ද | අවුරුදු 05න් පසු වැඩිවන සෑම වර්ෂයකටම ලකුණු 02 බැගින් | 15 | **15** |
| 03. පරිගණක හැකියාව<br>• රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට අදාළ ආයතනයෙන් ලිඛිත ලියවිල්ලක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි | රජයේ ලියාපදිංචි ආයතනයකින් පිරිනමන ලද පරිගණක පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සහතිකයක් | 3 | **5** |
| | රජයේ ලියාපදිංචි ආයතනයක පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | 2 | |
| 04. මව් භාෂාව හා දෙවන භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණතාව (සහතික මඟින් සනාථ කළ යුතුය) | ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් පිළිබඳව අවම වශයෙන් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීම | 5 | **5** |
| | අ.පො.ස. (උ.පෙළ) විෂයයක් ලෙස ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් හදාරා තිබීම (01 යටතේ ලකුණු ලබා දුන්නේ නම් මේ සඳහා සලකා බලනු නොලැබේ.) | 2 | |
| 05. ආයතනයේ අභිවෘද්ධියට දක්වන ලද දායකත්වය | ප්‍රශංසා ලිපි - එක් ලිපියකට ලකුණු 2.5 බැගින්<br>• තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතු යි. | 5 | **5** |
| | ඇගයීම් එක් ලිපියකට - එක් ලකුණ බැගින්<br>• තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතු යි. | 5 | |
| 06. සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාව | පෞරුෂත්වය | 3 | **5** |
| | සන්නිවේදන කුසලතා | 2 | |
| | භාෂා හැසිරවීම | 1 | |

(සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.)

***සටහන 1***

සහතිකය ඉදිරිපත් කරනු ලබන ආයතනයේ රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් විය යුතු අතර එසේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට ලියාපදිංචි අංකය සඳහන් ලිඛිතව තහවුරු කිරීමක් අදාළ ආයතනය වෙතින් ලබාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරු විසින් සිදු කළ යුතු ය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

I. අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රාජ්‍ය සේවයෙන් පහ කිරීමට වුව ද යටත්වේ.

12. *විභාග කොන්දේසි :*

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (Email) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම්කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග ගාස්තුව ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතුය.

(*අ*) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින්(Any Bank Credit Card)
(*ආ*) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)
(*ඇ*) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මඟින් (Online Banking Method/ Flex App of Bank of Ceylon)
(*ඈ*) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් ( Any Branch of the Bank of Ceylon)

***සටහන :-***

ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

14. ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් වශයෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

15. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

16. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

17. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

18. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

19. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

20. අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනයක් දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

**21. විභාගයට ඇතුළත් කර ගැනීම :**

(*අ*) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම

එම ශාලාවේ පෙනී සිටින පළමු විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළකර ඇත.

*සටහන* - අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

22. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත ;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමකින් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳගෙන නොමැති බව තහවුරුකර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

23. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්.

2026 ජූලි මස 21 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

07 - 499/1

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණයේ තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය) III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2025(2026)

01. අමප 25/1691/802/004 – X හා 2025.09.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි **තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 නොවැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ* **www.doenets.lk** වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 අගෝස්තු මස 03 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 අගෝස්තු මස 31 දින ප.ව. 09.00ට අවසන් වේ.**

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව **තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීමට තෝරා ගනු ලැබේ.

03. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

(*අ*) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහ 2022.12.14 දිනැති** ***අති විශෙෂ ගැසට් පත්‍රයේ*** **පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය**

**පටිපාටික රීතීවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

(ආ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, අමාත්‍යාංශ ලේකම් හට ඒ සඳහා බලය ඇත.

(ඇ) මෙම පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්වේ. **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02** සේවා ගණයේ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පරිදි බඳවාගෙන වසර 03ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු යි.

(ඈ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන අංක 18/2020 සහ ඊට ආනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

**04. 2025.03.25 දිනැති 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු.45,230 -10x540 -11 x 630 -10 x 890 - 10 x1,190 - 78,360 ක් වේ. එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.**

05. **මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.)**

06. **තනතුරට අයත් කාර්ය භාරය :**

**තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)**

1. **පාසල්වල තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණවේදය (සිවිල් තාක්ෂණවේදය, විදුලි තාක්ෂණවේදය හා යාන්ත්‍රික තාක්ෂණවේදය) විද්‍යාගාර තුනෙන් නියමිත විද්‍යාගාරයෙහි උපකරණ පිළිබඳව සම්පූර්ණ වගකීම.**

2. **ඉංජිනේරු තාක්ෂණවේදය (සිවිල් තාක්ෂණවේදය, විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය හා යාන්ත්‍රික තාක්ෂණවේදය) අදාළ තොග පොත් හා ක්ෂය ද්‍රව්‍ය ලේඛන විෂයය උගන්වන ගුරු භවතුන්ගේ අධීක්ෂණය යටතේ නිසි පරිදි පවත්වාගෙන යාම.**

3. **හිඟ හඳුනා ගැනීම හා අවශ්‍ය ප්‍රමාණ ඇණවුම් කිරීම සඳහා විෂයය උගන්වන ගුරු භවතාට සහාය වීම.**

4. **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති තාක්ෂණ පීඨ මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ අවබෝධය හා ඒ අනුව කටයුතු කිරීම සහ ඉදිරියේදී නිකුත්වන චක්‍රලේඛ හා රෙගුලාසි අනුව කටයුතු කිරීම.**

5. **අවශ්‍ය අවස්ථාවන්හිදී අදාළ ක්‍රියාකාරකම් සඳහා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, විෂය උපකරණ වැඩ මේස හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කරන ස්ථාන සිසුන් වෙත සූදානම් කර දීම හා ඊට අවශ්‍ය සහයෝගය ලබා දීම.**

6. **අලුත්වැඩියා මට්ටමේ පවත්නා උපකරණ හඳුනාගැනීම හා ඊට අදාළ නඩත්තු කටයුතු හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.**

7. **ක්‍රියාකාරකම් අවසන් වූ පසු අදාළ විෂය උපකරණ නඩත්තු ක්‍රියාකාරකම්වලට යටත්ව ඒවා නැවත ගබඩා කිරීම.**

8. **තාක්ෂණ පීඨයේ ප්‍රධාන විදුලි පරිපථය හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු වන අවස්ථාවේ හා ක්‍රියාකාරකම් අවසන් වූ පසු ආරක්ෂක ක්‍රමවේද අනුගමනය කිරීම.**

9. **කර්මාන්ත ශාලාවක් තුළ පවත්වාගෙන යා යුතු ආරක්ෂක ක්‍රමවේද පිළිබඳ අවබෝධය හා ඒ අනුව කටයුතු කිරීම.**

10. **තම සේවා විෂය පථයට අදාළ කරුණු පිළිබඳව තමාගේ අධීක්ෂණ නිලධාරින් සමඟ මනා සම්බන්ධතාවක් පවත්වාගෙන යාම සහ තනතුරට අදාළ පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.**

07. **සුදුසුකම් : -**

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයට අයත්** තනතුරුධාරින් සීමිත පදනම මත **තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)** යන තනතුරට අයදුම් කිරීමට,

(අ) **අධ්‍යාපන සුදුසුකම් : -**
**තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී මව් භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

(ආ) **පළපුරුද්ද : -**

නියමිත දිනට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථාන ඇතුළු සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත් ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඇ) **වෙනත් සුදුසුකම් : -**

I. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර පත්වීමක් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කර තිබිය යුතු ය.

II. යම් තනතුරක ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම්/ කොන්ත්‍රාත් පදනම මත සේවා කාල පරිච්ඡේදයන් සහ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇති පුහුණුවීම් කාල පරිච්ඡේද ගණන් ගනු නොලැබේ.

III. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති විය යුතු ය.

V. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර තිබිය යුතුය.

VI. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

VII. උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

08. විභාග පටිපාටිය :

මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

09. ඇගයීමේ ක්‍රමවේදය :

| | ලකුණු |
|---|---|
| සාමාන්‍ය දැනීම (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 01) |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 01) |
| යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය | 50 |

**I සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි ලකුණු 100 )**

ඉහත 06 හි දක්වා ඇති පරිදි තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම

**II බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි ලකුණු 100 )**

අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කර ඇති බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

**III යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය (ලකුණු 50 )**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයන් විසින් මෙහි 10 ඡේදය යටතේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු යි. මෙහි දී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ.

මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය යන එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් ලබා සමත් විය යුතු ය. ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු හෝ කුසලතා අනුපිළිවෙළ

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙනු නොලැබේ) ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව ලකුණු ලබා දෙන අතර මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත් ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුව මත එක් එක් අයදුම්කරුවන්ගේ කුසලතාව නිර්ණය කරනු ලැබේ.

10. **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය) තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ පටිපාටිය - 2025(2026)**

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු* | |
|---|---|---|---|
| 01 .අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>i අ.පො.ස (සා.පෙළ) | • විශිෂ්ට සාමර්ථ්‍යය - එක් විෂයයකට ලකුණු 02 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 01 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් (ගණිතය, මව්බස, ඉංග්‍රීසි තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යය ලබා තිබීමට අමතරව ) | 10 | 15 |
| ii . අ.පො.ස (උ.පෙළ) | • විශිෂ්ට සාමර්ථ්‍යය - එක් විෂයයකට ලකුණු 2 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 1 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් | 5 | |
| iii . උපාධි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. | 15 | |
| 02. සේවා පළපුරුද්ද | අවුරුදු 05න් පසු වැඩිවන සෑම වර්ෂයකටම ලකුණු 02 බැගින් | 15 | 15 |
| 03. පරිගණක හැකියාව<br>• රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට අදාළ ආයතනයෙන් ලිඛිත ලියවිල්ලක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි | රජයේ ලියාපදිංචි ආයතනයකින් පිරිනමන ලද පරිගණක පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සහතිකයක් | 3 | 5 |
| | රජයේ ලියාපදිංචි ආයතනයක පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | 2 | |
| 04. මව් භාෂාව හා දෙවන භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණතාව (සහතික මඟින් සනාථ කළ යුතුය) | ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් පිළිබඳව අවම වශයෙන් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීම | 5 | 5 |
| | අ.පො.ස. (උ.පෙළ) විෂයයක් ලෙස ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් හදාරා තිබීම (01 යටතේ ලකුණු ලබා දුන්නේ නම් මේ සඳහා සලකා බලනු නොලැබේ.) | 2 | |
| 05. ආයතනයේ අභිවෘද්ධියට දක්වන ලද දායකත්වය | ප්‍රශංසා ලිපි - එක් ලිපියකට ලකුණු 2.5 බැගින්<br>• තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතුයි. | 5 | 5 |
| | ඇගයීම් එක් ලිපියකට - එක් ලකුණ බැගින්<br>• තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතුයි. | 5 | |
| 06. සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාව | පෞරුෂත්වය | 3 | 5 |
| | සන්නිවේදන කුසලතා | 2 | |
| | භාෂා හැසිරවීම | 1 | |

(සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.)

*සටහන 1*

සහතිකය ඉදිරිපත් කරනු ලබන ආයතනයේ රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් විය යුතු අතර එසේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට ලියාපදිංචි අංකය සඳහන් ලිඛිතව තහවුරු කිරීමක් අදාළ ආයතනය වෙතින් ලබාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරු විසින් සිදු කළ යුතු ය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -:

I. අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රාජ්‍ය සේවයෙන් පහ කිරීමට වුව ද යටත්වේ.

12. විභාග කොන්දේසි :

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (Email) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග ගාස්තුව ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතු ය.

(*අ*) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

(*ආ*) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)

(*ඇ*) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon )

(*ඈ*) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් ( Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

14. ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් වශයෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

15. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

16. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

17. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ

විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

18. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

19. පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනයක් දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

20. විභාගයට ඇතුළත් කර ගැනීම :

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින පළමු විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළකර ඇත.

***සටහන* -** අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

21. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳගෙන නොමැති බව තහවුරුකර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

22. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්.

2026 ජූලි මස 21 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

07 - 499/2

---

**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

සහකාර රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය - 2026

අංක 1939/4 හා 2015.11.02 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* II වන කොටස ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය සඳහා මතු දැක්වෙන සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් **2026.08.21** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. එම විභාගය, 2026 සැප්තැම්බර් මස **කොළඹ දී** පවත්වනු ඇත.

**01. සුදුසුකම් :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සියලු අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. වයස අවුරුදු 23ට නොඅඩු හා 65ට නොවැඩි විය

යුතු ය. (ඒ අනුව 2003.08.21 දින හෝ ඊට පෙර හා 1961.08.21දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

iii. අටවන ශ්‍රේණියට සුදුසුකම් ලැබීමේ විභාගය හෝ සමාන විභාගයක් සමත් විය යුතු ය.

iv. රියදුරු පාසලක සේවා නියුක්තිකයෙක් වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. සේවක අර්ථසාධක අරමුදල් අංකය(EPF) හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් අංකය (ETF) අංකය ඇතුළත් වන ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

v. ඉල්ලුම් කරනු ලබන සහකාර රියදුරු උපදේශක පන්තියට අදාළ වන වාහන පන්ති සඳහා පහත දැක්වෙන පරිදි යටත් පිරිසෙන් අවුරුදු 05කට පෙර ලබා ගත් රියදුරු බලපත්‍රයක් ඉල්ලුම්කරුවන් සතු විය යුතු ය.

- මෝටර් කාර් ද්විත්ව කාර්යය වාහන (B), මෝටර් ත්‍රියිසිකල්/ මෝටර් ත්‍රියිසිකල් වෑන් (B1) සහ යතුරු පැදි (A) යන වාහන පන්ති සඳහා වලංගු රියදුරු බලපත්‍රය;

*හෝ*

- මෝටර් කාර් රථ/ ද්විත්ව කාර්යය වාහන (B) වාහන පන්තිය සඳහා වලංගු රියදුරු බලපත්‍රය;

*හෝ*

- මෝටර් ත්‍රියිසිකල්/ මෝටර් ත්‍රියිසිකල් වෑන් (B1) සහ යතුරු පැදි (A) යන වාහන පන්ති සඳහා වලංගු රියදුරු බලපත්‍රය;

*හෝ*

- රියදුරු බලපත්‍ර පන්ති සඳහා වලංගු බලපත්‍රයක් හිමි අයදුම්කරුවෙකුට සහකාර රියදුරු උපදේශක බලපත්‍රය ලබාගැනීම සඳහා ඉල්ලුම් කිරීමට හැකියාව පවතී.

vi. තමා අදාළ වාහන පන්තිවල රිය පැදවීමට හා රිය පැදවීම පුහුණු කිරීමට සෞඛ්‍යමය අතින් සුදුසු බව ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් වෛද්‍ය නිලධාරියෙක් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයක් මගින් තහවුරු කළ යුතු ය.

vii. රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ වෙනත් එවැනි ආයතනයක පුහුණු කිරීමේ කාර්යයේ යෙදී සිටින තැනැත්තෙකු හැර ඔහු හෝ ඇය එවැනි ආයතනයක සේවා නියුකුතිකයෙකු නොවිය යුතු ය.

**02. විභාග ක්‍රමය :**

i. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

ii. සියලු ප්‍රශ්න පත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු සැපයිය යුතු ය. මුලදී ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**03. විභාගයට අදාළ විෂයයන් හා ලිඛිත විභාගය :**

මෙම විභාගය මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ කොටස් දෙකකින් යුතු ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය.

| ප්‍රශ්න පත්‍රය | | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1. | මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය I | පැය 02 | 100 | 40 |
| 2. | මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය II | පැය 02 | 100 | 40 |

**04. විෂයය නිර්දේශය :**

මෙම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම මෝටර් වාහන පනත, මාර්ග නීති මාර්ගෝපදේශ සංග්‍රහය, ඉගැන්වීමේ හා උපදේශ දීමේ ක්‍රමවේද, ආරක්ෂිතව රිය පැදවීම, ආචාර ධර්ම, ප්‍රථමාධාර, කාර්මික හා තාක්ෂණික දැනුම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ.

**05. තේරීම් පටිපාටිය :**

එක් එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40 වන පරිදි සමස්ත ලිඛිත විභාගයෙන් 40%ක් හෝ එයට වඩා ලකුණු ලබාගත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සහතික හා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගන්නා ලද අයදුම්කරුවන් රියදුරන් පුහුණු කිරීමේ උපදෙස් ලබා දීම හා පුහුණුව ලබා දීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. මෙම පරීක්ෂණයෙන් තෝරාගන්නා අයදුම්කරුවන් රියදුරු උපදේශක පාඨමාලාවකට සහභාගි විය යුතු අතර, එය සාර්ථකව හැදෑරීමෙන් පසු, රියදුරු උපදේශන බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

උපදේශක පාඨමාලාව සඳහා නියම කරනු ලබන ගාස්තු අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු ය.

**06. ප්‍රතිඵල නිකුත් කිරීම :**

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල තැපැල් මගින් හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ www.slida.lk වෙබ් පළ කිරීම මගින් දන්වනු ඇත.

**07. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල වියයුතු අතර එය කඩදාසියේ

දෙපැත්ත පාවිච්චි කරමින් 8.27"x11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් ම පිරවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය. තව ද ආදර්ශ ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ඉල්ලුම් පත්‍රය පිළියෙල කළ යුතු ය.

(ආ) ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම විය යුතු ය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපැලෙන් 2026.08.21 දින හෝ ඊට පෙර ලැබෙනු පිණිස "**මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, ආයතන අංශය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ඇල්විටිගල මාවත, කොළඹ 05**" වෙත එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සහකාර **රියදුරු උපදේශකයින් බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය - 2026"** යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාරගනු නොලැබේ.

(ඈ) විභාග ගාස්තුව රු. 3000/- ක් වේ. එම ගාස්තුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ 20-03-02-14 අංක දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින්/ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තු ලෙස මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඉ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන ග්‍රාම නිලධාරි හෝ මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඊ) සෑම අකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ.

(උ) අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් ඒ පිළිබඳව අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් විමසීම් කල යුතු ය. එසේ විමසීම් කිරීමේදී තමා අයදුම් කල විභාගයේ නම අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කල යුතු ය. එසේ විමසීම් කිරීමේ දී, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විමසා සිටි යම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කල කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. විමසීම් කිරීම සඳහා සංවර්ධන පරිපාලන අයතනයේ 0115980200 දුරකතන අංකය භාවිත කරන්න.

**08. අපේක්ෂකයාගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීමට ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොත් සිට විභාගය අවසන් වී ඉන් පිටවවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී

හෝ විභාගයයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම්, යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු වෙත රියදුරු උපදේශක බලපත්‍රයක් නිකුත් නොකිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව තීරණය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් ගනු ලැබේ.

**10**. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැලපීමක් ඇතිවුව හොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

**කේ.පී.එන්.ටී.එන්. දේවප්‍රිය,**
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් *(වැ.බ).*

2026 ජූලි මස 24 වැනි දින,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

Specimen Application From

*මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*

Department of Moter Traffic

*සහකාර රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය - 2026*

Written Examination for Registration of Assistant Driving Instructors – 2026

විභාගයට පෙනී සිටින මාධ්‍ය ☐ සිංහල - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) දෙමළ - 2
ඉංග්‍රීසි - 3

01. (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.........................

(උදා:-HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ආ) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ...........................
.............................................................................

(උදා:- GUNAWARDHANA,H.M.S.K)

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්): ..................................

02. (අ) ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.........................

(ආ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):............................

(ඇ) රියදුරු පාසලේ නම සහ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.........................

03. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ යොදන්න)
ස්ත්‍රී - 1

05. දුරකතනඅංකය :

ජංගම :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ස්ථාවර :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06 ඉල්ලුම්කරුගේ වයස හා උපන් දිනය :

(අ) වයස................ (ආ) උපන් දිනය ..............................

07. අධ්‍යාපන සුදුසුකම්: .......................................

08. පළපුරුද්ද: .........................

(සනාථ කිරීමේ ලේඛන අමුණන්න)

09. (අ). විභාග ගාස්තුව රු.3000/- වන අතර එම මුදල ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ඉහත සඳහන් තොරතුරු මාගේ උපරිම දැනීමට අනුව සියලු ආකාරයෙන් නිවැරදි බව මම ප්‍රකාශ කර සිටිමි. තව ද විභාගය පැවැත්වීමට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

................ ..............................,

දිනය ඉල්ලුම්කරුගේ අත්සන.

***අත්සන සහතික කිරීම :***

මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන........................................................... මහතා/ මහත්මිය/ මෙනවිය........................... දින සිට මා ඉදිරිපිට දී අත්සන් කල බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

...........................................,

සහතික කරන්නාගේ අත්සන.

නම:.....................................

පදවිය:................................ (නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

ලිපිනය:................................

දිනය:.................................

07 - 563/1

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### රියදුරු උපදේශකයින් ලියාපදිංචිය සඳහා වන ලිඛිත විභාගය - 2026

අංක 1939/4 හා 2015.11.02 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* II වන කොටස ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය සඳහා මතු දැක්වෙන සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2026.08.21 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. එම විභාගය, 2026 සැප්තැම්බර් මස කොළඹ දී පවත්වනු ඇත.

**01. *සුදුසුකම් :***

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සියලු අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii. වයස අවුරුදු 23 ට නොඅඩු හා 65 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2003.08.21 දින හෝ ඊට පෙර හා 1961.08.21 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

iii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ගණිතය විෂයය සහ සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සම්මාන දෙකක් සහිතව පෙනී සිටීම් වාර දෙකකට නොවැඩි ගණනකින් සමත්ව තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් වන අවම සුදුසුකමක් තිබිය යුතු ය.

*හෝ*

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III (NVQ – Level 3) මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව හෝ රියදුරු වෘත්තියට අදාළ ක්ෂේත්‍රයක් සඳහා සහතිකයක් තිබිය යුතු ය;

*හෝ*

ඉල්ලුම් කරන දිනයට පෙර අවුරුදු පහක් සඳහා සහකාර රියදුරු උපදේශකවරයෙකු ලෙස පළපුරුද්ද තිබිය යුතු ය;

iv. (*අ*) ඉල්ලුම් කරනු ලබන උපදේශක පන්තියට අදාළ වන වාහන පන්ති සඳහා පහත දැක්වෙන පරිදි යටත් පිරිසෙන් අවුරුදු 05 කට පෙර ලබාගත් වලංගු රියදුරු බලපත්‍රයක් ඉල්ලුම්කරුවන් සතු විය යුතු ය.

- A පන්තියේ රියදුරු උපදේශක - බර මෝටර් ලොරි (CE) සහ මෝටර් කෝච් (D) / බර මෝටර් කෝච් (DE) සහ යතුරු පැදි (A) යන වාහන පන්ති සඳහා වලංගු රියදුරු බලපත්‍රය
- B පන්තියේ රියදුරු උපදේශක - මෝටර් කෝච් (D) සහ යතුරු පැදි (A) යන වාහන පන්ති සඳහා වලංගු රියදුරු බලපත්‍රය
- C පන්තියේ රියදුරු උපදේශක - මෝටර් කාර් රථ/ ද්විත්ව කාර්ය වාහන (B), මෝටර් ට්‍රයිසිකල්/ මෝටර් ට්‍රයිසිකල් වෑන් (B1) සහ යතුරු පැදි (A) යන වාහන පන්ති සඳහා වලංගු රියදුරු බලපත්‍රය හෝ
- මෝටර් කාර් රථ/ ද්විත්ව කාර්ය වාහන (B) වාහන පන්ති සඳහා වලංගු බලපත්‍රය හෝ
- මෝටර් ට්‍රයිසිකල්/ මෝටර් ට්‍රයිසිකල් වෑන් (B1) සහ යතුරු පැදි (A) යන වාහන පන්ති සඳහා වලංගු රියදුරු බලපත්‍රය හෝ
- බලපත්‍රයක් හිමි අයදුම්කරුවෙකුට ශ්‍රේණියේ රියදුරු උපදේශක බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කිරීමට හැකියාව පවතී.

(*ආ*) සියලු අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වසර 05ක පළපුරුද්දක් සහිතව ඉහත සඳහන් කුමන හෝ වාහන පන්තියක් සහිත වලංගු වූ රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.

v. අදාළ වාහන පන්තිවල රිය පැදවීමට හා රිය පැදවීම පුහුණු කිරීමට සෞඛ්‍යමය අතින් සුදුසු බවට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන විසින් ලබා දෙන වෛද්‍ය සහතිකයක් මගින් තහවුරු කළ යුතු ය.

vi. රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ වෙනත් එවැනි ආයතනයක සේවා නියුක්තිකයකු හට මේ සඳහා ඉල්ලුම් කළ නොහැකි අතර එවැනි ආයතනයක රියදුරු පුහුණු කිරීමේ කාර්යයේ යෙදී සිටින තැනැත්තෙකු නම් අදාළ ආයතන ප්‍රධානියා මගින් අයදුම් පත ඉදිරිපත් කළ හැකි වේ.

**02. විභාග ක්‍රමය :**

i. මෙම විභාගය සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

ii. සියලු ප්‍රශ්න පත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු සැපයිය යුතු ය. මුලදී ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**03. විභාගයට අදාළ විෂයයන් හා ලිඛිත විභාගය :**

මෙම විභාගය මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ කොටස් දෙකකින් යුතු ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය.

| ප්‍රශ්න පත්‍රය | | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1. | මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය I | පැය 02 | 100 | 40 |
| 2. | මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය II | පැය 02 | 100 | 40 |

**04. විෂය නිර්දේශය :**

මෙම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම මෝටර් වාහන පනත, මාර්ග නීති මාර්ගෝපදේශ සංග්‍රහය, ඉගැන්වීමේ හා උපදේශ දීමේ ක්‍රමවේද, ආරක්ෂිතව රිය පැදවීම, ආචාර ධර්ම, ප්‍රථමාධාර, කාර්මික හා තාක්ෂණික දැනුම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ.

**05. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු අතර එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8.27"x11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් පිරවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය. තව ද ආදර්ශ ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ඉල්ලුම් පත්‍රය පිළියෙළ කළ යුතු ය.

(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම විය යුතු ය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2026.08.21 දින හෝ ඊට පෙර ලැබෙනු පිණිස **මෝටර් රථ කොමසාරිස් ජනරාල්, ආයතන අංශය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ඇල්විටිගල මාවත, කොළඹ 05** වෙත එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව **රියදුරු උපදේශකයින් බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය-2026"** යන වචන ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාරගනු නොලැබේ.

(ඈ) විභාග ගාස්තුව රු. 3000/- ක් වේ. එම ගාස්තුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-14 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින්/ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තු ලෙස මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඉ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු,දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන ග්‍රාම නිලධාරි හෝ මාණ්ඩලික නිලධාරියකු සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඊ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉල්ලුම් පත් ලද බව දන්වනු නොලැබේ.

(උ) අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙකු වෙනම් ඒ පිළිබඳව අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් විමසීම් කළ යුතු ය. එසේ විමසීම් කිරීමේ දී තමා අයදුම්කළ විභාගයේ නම අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. එසේ විමසීම් කිරීමේ දී, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විමසා සිටි යම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම් ප්‍රයෝජනවත් වනු ඇත. විමසීම් කිරීම සඳහා සංවර්ධන පරිපාලන ආයතනයේ 0115980200 දුරකතන අංකය භාවිතා කරන්න.

**06. අපේක්ෂකයාගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා

සැඟීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීමට ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**07. ප්‍රතිඵල නිකුත් කිරීම :**

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල තැපැල් මගින් හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ www.slida.lk වෙබ් පළ කිරීම මගින් දන්වනු ඇත.

**08. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම්, යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු වෙත රියදුරු උපදේශක බලපත්‍රයක් නිකුත් නොකිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

**09. තේරීම් පටිපාටිය :**

එක් එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40 වන පරිදි සමස්ත ලිඛිත විභාගයෙන් 40%ක් හෝ එයට වඩා ලකුණු ලබාගත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සහතික හා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගන්නා ලද අයදුම්කරුවන් රියදුරන් පුහුණු කිරීමේ උපදෙස් ලබා දීම හා පුහුණුව ලබා දීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. මෙම පරීක්ෂණයෙන් තෝරාගන්නා අයදුම්කරුවන් රියදුරු උපදේශක පාඨමාලාවකට සහභාගි විය යුතු අතර, එය සාර්ථකව හැදෑරීමෙන් පසු, රියදුරු උපදේශක බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.
උපදේශක පාඨමාලාව සඳහා නියම කරනු ලබන ගාස්තු අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු ය.

**10**. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

**කේ.පී.එන්.ටී.එන්. දේවප්‍රිය,**
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් *(වැ.බ.).*

2026 ජුලි මස 24 වැනි දින,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

Specimen Application Form

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

Department of Moter Traffic

රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය - 2026

Written Examination for Registration of Driving Instructors – 2026

විභාගයට පෙනී සිටින මාධ්‍ය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐ සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

01. (*අ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.........................

(*ආ*) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........................
...............................................................................

(*ආ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්): ...................................

02. (*අ*) ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.........................

(*ආ*) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):.............................

(*ඇ*) රියදුරු පාසලේ නම සහ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..........................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ යොදන්න)
ස්ත්‍රී - 1

05. දුරකථනඅංකය :

ජංගම :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

ස්ථාවර :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

06 ඉල්ලුම්කරුගේ වයස හා උපන් දිනය :

(*අ*) වයස................ (*ආ*) උපන් දිනය ..............................

07. අධ්‍යාපන සුදුසුකම් : ........................................
අ.පො.ස. (සා.පෙළ)

| *අනු අංකය* | *විෂයය* | *සමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

08. පළපුරුද්ද: .........................

(සනාථ කිරීමේ ලේඛන අමුණන්න)

09. (අ). විභාග ගාස්තුව රු.3000/- වන අතර එම මුදල ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ඉහත සඳහන් තොරතුරු මාගේ උපරිම දැනීමට අනුව සියලු ආකාරයෙන් නිවැරදි බව මම ප්‍රකාශ කර සිටිමි. තව ද විභාගය පැවැත්වීමට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

................ .............................,
දිනය ඉල්ලුම්කරුගේ අත්සන.

**අත්සන සහතික කිරීම :**

මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන........................................................... මහතා/ මහත්මිය/ මෙනවිය.......................... දින සිට මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

..........................................,
සහතික කරන්නාගේ අත්සන.

නම:....................................
පදවිය:................................ (නිල මුද්‍රාවෙන් සහතික කරන්න)
ලිපිනය...............................
දිනය:.................................

07 - 563/2

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 200ක් සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමට පවත්වනු ලබන තරග විභාගයට පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ "මුදල් පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්" වේ. "සේවය" යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂී කොට සඳහන් කර නොමැති අවස්ථාවන්හි දී " ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය" වේ.

2. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණිය සඳහා වේ. මෙම බඳවා ගැනීම ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කරනු ලැබේ.

*ගැසට්* නිවේදනය පළවන සිකුරාදා දිනට පසුව එළඹෙන සඳුදා දින මාර්ගගත අයදුම්පත් භාර ගැනීම ආරම්භ වේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications (Recruitment/ EB Exams)" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ

හැක්කේ මාර්ගගත ක්‍රමයට (online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 අගෝස්තු මස 03 වැනි දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර 2026 අගෝස්තු මස 31 වැනි දින ප.ව. 9.00 ට අවසන් වේ.**

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ඔක්තෝබර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

3. මෙම තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

4. දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

5. සේවා කොන්දේසි :

5.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක: 1804/50 සහ 2013.04.05 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

5.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

5.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 03ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

6. *වැටුප් පරිමාණය :-* 2025.03.25 දිනැති අංක : 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 82,150 -10x2,400-8x2,940-17x3,900-රු. 195,970/- (SL-1-2025)වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

7. බඳවා ගැනීමේ සුදුසුකම් :-

(*අ*) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් කායික හා මානසික හා අන් සෑම අයුරකින්ම යෝග්‍යතාවකින් යුක්ත වීම;
(iv) යම් ආගමික නිකායක පූජකවරයක් දරන තැනැත්තකු නොවිය යුතු ය.
(v) විවෘත තරග විභාගය සඳහා වාර දෙකකට (02) වඩා පෙනී නොසිටිය යුතු ය. (පෙර සේවා ව්‍යවස්ථාව යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ II/II ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ.
(vi) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(*ආ*) අධ්‍යාපන සුදුසුකම් :

I. (*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන පළමුවන හෝ දෙවන පන්තියේ පන්ති සාමර්ථයක් සහිත උපාධියක්

*හෝ*

(*ආ*) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු

ලබන පළමුවන හෝ දෙවන පන්තියේ පන්ති සාමාර්ථයක් සහිත උපාධියක්

*හෝ*

(*ඇ*) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් පළමුවන හෝ දෙවන පන්තියේ පන්ති සාමාර්ථයක් සහිත උපාධියක් ලබා තිබීම (අධ්‍යයන කාලය අවම වශයෙන් වසර තුනක් (03) විය යුතු ය.)

*හෝ*

II. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වීම

*හෝ*

III. වරලත් ගණකාධිකාරීවරයකු වීම

*සටහන -* ඉහත (ආ) හි සඳහන් I, II, III සුදුසුකම් බලපවත්නා දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය.

(*ඇ*) වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිදෙකට (22) නොඅඩු විය යුතු අතර, අවුරුදු විසි අටට (28) නොවැඩි විය යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2004.08.31 දින හෝ ඊට පෙර හා 1998.08.31 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස අවුරුදු 35 වේ. (රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතු ය.)

8. බඳවා ගැනීමේ ක්‍රමය -

8.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අවබෝධය | 100 | 40 |
| 2. බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 3. සාමාන්‍ය දැනීම | 100 | 40 |

8.1.1 ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :

විෂයය අංක 01 - අවබෝධය :

අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කරගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ.

(කාලය පැය 1 1/2 - ලකුණු 100)

විෂයය අංක 02 - බුද්ධි පරීක්ෂණය :

අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ.

(කාලය පැය 1 - ලකුණු 100)

විෂයය අංක 03 - සාමාන්‍ය දැනීම :

ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර්ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කාලීන තත්ත්වයන් මෙන් ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව දැනුම පිරික්සීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්නවලින් පමණක් යුක්ත වේ.

(කාලය පැය 1 - ලකුණු 100)

8.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

(i) ඉහත අංක 07 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර ලකුණු ලබා දීමක් සිදු නොවේ.

(ii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු හතළිහක් (40) හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්තාවෝචිත පරිදි ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබාගත් කුසලතා අනුපිළිවෙළ හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත පරිදි තීරණය කරනු ලබන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබනනේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

(iii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.

***සැලකිය යුතුයි :***

සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

8.3 පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්, ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් මෙම සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

8.4 කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පිරවීමේ දී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එම බඳවා ගැනීම 2024.03.14 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 අනුව සිදු කරනු ලැබේ.

9. විභාග මාධ්‍ය :-

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත් වේ.

(ආ) අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි ය.

***සටහන :***

(i) අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් පමණි.
(ii) අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iii) සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර (03) ටම පෙනී සිටිය යුතු ය.

10. විභාග අයදුම්පත් :

I. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. විභාග ගාස්තුව රු. 1,200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවිමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)
(iii) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon )
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් ( Any Branch of the Bank of Ceylon)

***සටහන :-***

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

12. විභාග ප්‍රවේශ පත්‍ර :

*ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්លුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

12.1 අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග දිනයේ දී ඉදිරිපත් කළ යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන :-*

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

13. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව - විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන් ලේඛන පමණක් වලංගු වේ.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන් ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

14. *ගැසට්* නිවේදනයේ 8.1 ඡේදයට අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් විභාගයේ දී ලබාගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

15. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් - අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති

බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

16. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු පරිදි කටයුතු කරනු ඇත.

17. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ 01.

07 - 566

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.